# සමූපකාර සමාගම්.

# Co-operative Societies,

( එක්සත් සහකාර සමාගම් සම්බන්ධ රිජිස්ට්‍රාර් තැනගේ වාර්තාවෙන් උපුටාගන්නාලදී. )

## සාමාන්‍ය දියුණුවේ සංක්‍ෂෙප සටහන.

14. මෙහි පහත පෙන්වන සංදේශයේ සමූපකාර සමාගම්ල දියුණුව පෙන්වා තිබේ :—

| අව්රුද්ද | සමාගම් ගණන. | සාමාජිකයන්ගේ ගණන. | ගෙවා තිබෙන අර මුදල | ආරක්‍ෂක මුදල |
|---|---|---|---|---|
| 1913 14 | 37 | 18,20 | රු. 8,200 0 | රු. 23·5 |
| 1914-15 | 54 | 3,850 | රු. 18,782·50 | රු. 746·93 |
| 1915-16 | 55 | 4,066 | — | — |
| 1916 17 | 71 | 6,027 | රු. 32,991·25 | රු. 3.245·72 |
| 1917-18 | 92 | 9,551 | රු. 48,549·10 | රු. 6,675 0 |
| 1918-19 | 113 | 11,310 | රු. 68,062·55 | රු. 11,243·17 |
| 1919-20 | 136 | 15,200 | රු. 99,284· 0 | රු. 14,662·22 |
| 1920-21 | 154 | 17,896 | රු. 122,070 92 | රු. 20,522.97 |
| 1921-22 | 169 | 19,957 | රු. 150,354 97 | රු. 25,057·17 |
| 1922-23 | 208 | 23,322 | රු. 188,689 50 | රු. 32,142·38 |
| 1923-24 | 222 | 26,757 | රු. 238,607· 2 | රු. 44,603·64 |
| 1924-25 | 257 | 30,548 | රු. 281,478 86 | රු. 65,161·99 |
| 1925-26 | 315 | 34,164 | රු. 362,987· 8 | රු. 73.183 39 |
| 1226-27 | 303 | 35,112 | රු. 430,311·38 | රු. 91,421·32 |
| 1927-28 | 360 | 33,057 | රු. 497,775·60 | රු. 91,730· 0 |

15 සමාගම්වල හරි දියුණුව පෙන්වීමට මේ ඉලක්කම් පමණක් ඉතාම දුර්වල පෙන්වීමක් [illegible] නුමුත් සාමාජිකයන්ගේ ගණනේ අඩුකමද, ආරක්‍ෂක මුදලේ ඉතාම ස්වල්ප වැඩිවීමද, කාටමුත් අසතුටුවීමට කරුණක්වේ. නුමුත් මේ ගැන කියන්ට තිබෙන්නේ පසුගිය අවුරුදු වාර්තාවේ දොලොස්වෙනි වගන්තියේ කියා තිබුණ ප්‍රකාර හරියාකාර වැඩනොකරණ, වැඩකරන්ටත් බැරි සමාගම් 35ක් අවලංගුකර දැමීමෙන්ද සමාගම්වල වැඩනොකරණ පදිංචිය වෙනස්වීමෙන් සාමාජිකත්වය නැති වූ සාමාජිකයන් මහත් ගණනක් අස්කර දැමීමෙන්ද නිසාවේ. පසුකී අන්දමේ සාමාජිකයන් බොහෝ ගණනක් තවමත් සිටිත්. නුමුත් මේ අවුරුද්දේ සාමාජික ගණන 33,057 හොඳකාර වැඩකරනැකි සාමාජිකයන්ගේ ගණනටතරමක් කිට්ටුවූව ගණනවේ.

16. ආරක්‍ෂක මුදලේ මුලු ප්‍රමාණය ගිය අව්රුද්දේ ගණනම වාගේය. වැඩිවී තිබෙන්නේ ඉතාම ටිකය. මේද පරණ සමාගම් 35ක් අවලංගුකරන්ටවීම හා අලුතෙන් ලියා පදිංචිකළ සමාගම්වලට ආරක්‍ෂක මුදලක් ඇතිකරගැනීමට කාලයක්

නොපැමිනීමද නිසාය. තවද මඩකලපුවේ සමාගම්වල ආරක්‍ෂක මුදලය කියා තිබුණාවූ ආරක්‍ෂක මුදලෙන් රු 5,921·21ක් මඩකලපුවේ වී බැන්කුව විසින් ඊට එන්ට තිබුනාවූ කල්පසුවූ ණයවලට හිලව්කරගැනීමත්ය. මක්නිසාදයත් මේ ආරක්‍ෂක මුදල් සමාගම් විසින් කවදාවත් නොලැබු·ලාභ මුදල්වලින් සාදාගත් ආරක්‍ෂක මුදලක්ව තිබුණු බැවිනි. ඒ සමාගම්වල හරියාකාර තත්‍වය පෙන්වන අන්දමට අමුතු අන්දමකට ගණන් හිලව් තැබීමට ක්‍රමයක් දැන් ආරම්භකර තිබෙ.

17. මෙහි පහත දක්වන විස්තරවලින්, සමාගම්වල ගණන, සාමාජිකත්වය, ගෙවා තිබෙන කොටස් මුදල, තැන්පත් මුදල, ආරක්‍ෂක මුදල, ලාභ, ණය ආදිය පෙන්වීමෙන් සමාගම්වල වැඩවල ඇති දියුණුව පෙණීයත්.

(1) සමාගම් ගණන :—

| | | මුළු ගණන | | ගොවිකර්මාන්ත. | ගොවිකර්මාන්ත නොවන |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | 303 | ... | 280 | 23 |
| 1927–28 | ... | 360 | ... | 341 | 19 |

(2) සාමාජික ගණන :—

| | | | | | |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | 35,112 | ... | 32,886 | 22,226 |
| 1926–28 | ... | 33,057 | ... | 29,277 | 3,780 |

(3) ගෙවා තිබෙන අරමුදල :—

| | | | | | |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 430,311·38 | ... | රු. 348,283·98 | රු. 82,027·40 |
| 1926–28 | ... | රු. 497,775·60 | ... | රු. 402,881·58 | රු. 94,894 02 |

(4) තැන්පත් මුදල :—

| | | | | |
|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 67,689.23 | ... | සියලුම සමාගම්වල. |
| 1926–28 | ... | රු. 114,102·22 | | |

(5) ආරක්‍ෂක මුදල :—

| | | | | | |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 91,421·31 | ... | රු. 80,012·30 | රු. 11,409 02 |
| 1926–28 | ... | රු. 91,730· 0 | ... | රු. 83,188·75 | රු. 8,541·25 |

(6) ලාභ :—

| | | | | |
|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 40,149·44 | ... | සියලුම සමාගම්වල. |
| 1926–28 | ... | රු. 60,439·75 | | |

(7) ණය ගනුදෙනු :—

| | | දෙන්ට යෙදුනා | | නැවත ලැබුනා | ඉතුරුව එන්ට තියෙනවා |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 593,099 61 | ... | රු. 498,812·19 | රු. 760,791·34 |
| 1926–28 | ... | රු 722,544·66 | ... | රු. 601,616·58 | රු. 786,892·16 |

(8) ආණ්ඩුවෙන් ණය හා වෙනත් ණය :—

(අ) ආණ්ඩුවෙන් (රටේ ණයදීමේ හා වර්ධනය පිළිබඳ අරමුදලෙන්)

| | | දෙන්ට යෙදුනා | | නැවත ලැබුනා | ඉතුරුව එන්ට තිබෙනවා |
|---|---|---|---|---|---|
| 1926–27 | ... | රු. 3[illegible],200 | ... | රු. 12,268·34 | රු. 158,208·62 |
| 1926–28 | ... | රු. 42,185 | ... | රු. 50,272·01 | රු. 150,121.61 |

(ආ) මඩකලපුවේ වී බැන්කුවෙන් :—

මඩකලපු දිසත්‍රික්කේ සමාගම්වලින් මඩකලපුවේ වී බැංකුවට යන්ට තියෙන ගණන

| | | | |
|---|---|---|---|
| 1927 අප්‍රෙල් 30වෙනිද | .. | රු. | 168,772·91 |
| 1928 අප්‍රෙල් 30වෙනිද | ... | රු. | 127,478·30 |

(ඉ) සමාගම්වලින් සමාගම්වලට :—

කැබිතිගොල්ලෑවේ සමාගම විසින් ආණ්ඩුවේ අච්චුකන්තෝරුවේ සමාගමෙන් ගන්ට යෙදුනා රු. 250.

18. තැන්පත් මුදල්වල වැඩිවීම සතුටුදායක ලකුණකි. නුමුත් මේ සමාගම් සාමාජිකයන්ගේ සහ අන්‍ය අයගේත් සම්භකරණ මුදලෙන් ඉතුරුකරගන්නා දෙය තැන්පත්කර තිබෙන්නාවූ බැංකු හැටියට ගණන්ගෙන වැඩකිරීම තවමත් හරියාකාර තේරුම්ගෙන නැත සමහර සමාගම්වල ඉතුරුකරගන්නාවූ සියල්ලම කොටස් මුදල්වලට එක එක සැබෑවකි. මේ ව්‍යාපාරය මගින් මෙවනතුරු ඉතුරුකරගෙන තිබෙන මුලු මුදල නම් කොටස් මුදල රු. 497,775 60ක්ද, සාමාජිකයන්ගේ තැන්පත් මුදල රු. 114,102·32ක්ද, ආරක්‍ෂක මුදල රු. 91,730ක්ද, සාමාජිකයන්ගේ ලාභ සහ පොලී මුදල 40,748·57ක්දවේ. මෙහි මුලු ගණන රු 744,356·51ක්ය. මෙය එසේ මෙසේ ඇතිවූ දියුණුවක් නොවේය. මක්නිසාදයත් මේ මුදල් ඉතුරුකරගෙන තිබෙන්නේ මේ සමාගම් පිහිටුවා දුන්නේ නැතිනම්, කිසිම දෙයක් ඉතුරුකරගන්ට බැරියයි කියන මනුෂ්‍ය කොඩ්ඨාශයක් විසින්ය.

19 ආණ්ඩුවට ගෙවන්ට යෙදී තිබෙන ණය ගණන වැඩිවී තිබෙනබව පෙණී යනවා ඇත. මෙය කාරණා දෙකක් නිසා සිදුවී තිබේ. පළමුව මඩකලපුවේ වී බැංකුව විසින් ණය අයකිරීම පිළිබඳ පෙන්වන්ට යෙදුනාවූ කඩිසරවක් ශෛථිල්‍ය භාවය හා අලුත් ණයදීම ගැණ ගන්ට යෙදුන වැඩි ප්‍රවේසම නිසාද, විශාල මුදලක් වී බැංකුවේ ඉතුරුවෙන්ට සිදුවීමයි. මේ මුදලෙන් රු. 26,400ක් (ආණ්ඩුවෙන්) රටේ ණය දීමේ හා වඩිනය පිළිබඳ අරමුදලෙන් දෙන්ට යෙදී තිබුන සමාගම් 13 කින් ඒ ණය වෙනුවට වී බැංකුවෙන් ණයට දුන්නේය. දෙවනුව වඩා ක්‍රියාකාර කමකින් වැඩ නොකර වෙන පළාත්වල තිබුණ සමාගම් ගණනක් විසින් ආණ්ඩුවෙන් සීයට 5 ගණනේ මුදල් ගෙණ ඒවා ගණු දෙනුවලට පාවිච්චි නොකර තැපැල් කන්තෝරු බැංකුවේ සීයට 2·4ට පොලී පිණිස යනමින් මුදල් ගණන් තැන්පත් කර තිබුණේය. එවැනි සමාගම් විසින් පාවිච්චිකරන්ට නුපුලුවන්වූ එම මුදල් ණය ගෙවීම් පිණිස යොදන්ට සැලැස්වීමදවේ.

20. සමාගම්වල ගණන 57කින් වැඩිවී දැනට 360ක්වී තිබේ. අලුත් සමාගම් 92ක් ලියාපදිංචි කරණලදී. 35ක් අවලංගු කරණලදී. සමාගම්වල සාමාන්‍ය සාමාජික ගණන ගිය අවුරුද්දේ තිබුණ ගණන 115·8වෙන් මේ අවුරුද්දේදී 91·8ක්වී තිබේ. නුමුත් තවමත් මේ ගණනත් ඉතාම වැඩිය. 1926 27 වර්‍ෂයේ වාර්තාවේ බොම්බායේ රිජිස්ට්‍රාර්තැන සමාගමක සාමාජික ගණන 65ක් දක්වා අඩුවීම හොඳ ලකුණක් හැටියට පෙන්වා තිබේ. නුමුත් මේ ගණන පංචාල දෙශයේ සාමාන්‍ය සාමාජික ගණනින් දෙපංගුවක්ටත් වඩා වැඩි බැවිද, (පංචාල දෙශයේ ගණන 28කටත් අඩුය) කියා තිබේ. සමහරවිට සෑහෙන ප්‍රමාණ විභාග නොකොට සාමාජිකයන් බන්දවා ගන්නාවූ වරදද පෙන්වා තිබේ. නුමුත් මේ වරද ඊට වඩා තදින් අප රට සමාගම් ගැන කියාපාන්ට මට පුළුවන. සමාගම්වලට නොසෑයෙන

සාමාජිකයන් බන්දවා ගන්ට බැරිය කියා කියන්ට ඉතාමත්ම අමාරු වැඩකි. නුමුත් සමහරවිට කලාතුරකින් මේ අන්දමට ඉෙඩයයී දෙනවා දකින්ට ලැබේ.

21. අවලංගුකර සමාගම් 35ක් නැතිවීම සමූපකාර ව්‍යාපාරයටවූ දලාභයක් නොවේය වෙන අන්දමට මහත් ප්‍රයෝජනවත ලෙස වැඩ කරන්ට හැකි කාලය මිඩන්ගු වන්නාවූද, දැන් තිබෙන හැටියට සමූපකාර වශයෙන් නොවටින්නාවූද, තවත් සමාගම් රැශියක් තිබේ. එනම් : බුරුම දෙශයේ රිජිෂ්ට්‍රාර්තැන කියන්ට යෙදුන ලෙස "වල් උදුරා දැමූවාසින් පසු එලවලු හා මල්වලට වැඩියෙන් කාලය ගතකිරීමට බලාපොරොත්තු තිබේ. නුමුත් සමාගම් අවලංගු කිරීම කරන්නේ වෙන කරන්ට සුදුසු ප්‍රතිකාරයක් නැතිඋනාට පසුය. සමාගම් නැතිකිරීමට පොරම යො දන්නේ සමාගම්වල ගම්සීමාව අඩුකර, වංක, අලස, නුසුදුසු සාමාජිකයන් නැති කොට සමාගම් ප්‍රතිසංස්කරණය කරන්ට සියලුම උත්සාහකොට ඒවා හරිනොයා නම් පමණය. සමාගම් ගණනක් හොඳින් ක්‍රියාකරද තිබේ.

### සමාගම් පංකතිවලට බෙදීම.

22. ගිය වර්ෂයේ සමාගම් පඩිකතිවලට බෙදුවේ නැත. සමූපාකාර ධර්මය කියා දීමේ සම්පූර්ණ විපර්යාසයක් ඇතිකර වැඩිකල් නොගිය නිසාද, අලුත් ක්‍රමයේ තත් වයකට සමාගම් ගෙනගිය යුතු නිසාද, ඒ ක්‍රම යටතේ වැඩකිරීමට සමාගවලට සාල් තිබුනේ නැත. එය කවමත් එසේමය. එම නිසා දැන් පෙන්නා තිබෙන තත් වයද, ඉතාම අශෙඩයයීමත්ය කියා සානස්සලු භාවයක් ඇතිකරගැනීමට උවමනා වක් නැත. එක්සත් සහකාර ධර්මයන් දිනකින් ඉගෙනගත හෝ උගැන්විය හැකි දෙයක් නොවේය. අවුරුදු හතරකින් හෝ පහකින් දියුණුවක් දකින්ට නොලැබු නේනම් කඳුලු හෙලන්ට පටන්ගත්තාට වරදක් නැත. දැනට නම් හොඳකාර පුහුනුකිරීමක් ඇතිකිරීමට ඉඩ ප්‍රසථාවන් ඇතිකරගත් සමාගම් වැඩි ගණනක් වයස මදිකමින් පඩිකතිවලට නොගත් සමාගම්වලට වෙන්කර තිබෙන ඒවාය.

23. පහත පෙන්වන අන්දමට සමාගම් පඩිකතිවලට බෙදීමට මේ අවුරුද්දේ උත්සාහකරණ ලද්දේය.

A.—හොඳ සමාගම්.
B.—මදක් හොඳ.
C.—නරක.
D.—අවලංගු කිරීමට ලංව තිබෙන.

### A—පඩිකතිය.

(1) සාමජිකයන්ගේ මූලුහරි උවමනාකම්වලට මුදල් සැපයීම.

(2) සාමාජිකයන් විසින් සමාගමෙන් පිට අයගෙන් ණයගැනීම නවත්වා තිබීම.

(3) ඉතුරුව එන්ට තියෙන මුලු ණය ගණනින් දහයෙන් පංගුවකට අඩු ගණ නක් නියම කලට නොගෙවාපු ණය ඇතිවීම.

(4) ආණ්ඩුවේ මූලාදැනින්ගේ ආධාරයක් නැතුව කාරක සභාව විසින් සියලුම ණය අයකරගැණීමට කටයුතු කිරීම.

(6) උසාවියට යෑම එහෙමෙත් කලාතුරයකින් වීම.

(7) සමූපකාර ප්‍රතිපත්ති හරියාකාර දැනීම හා අභ්‍යාස කිරීම.

(8) අවුරුදු දෙකකට වැඩි කාලයක් වැඩකිරීම.

(9) සාමාජිකයන්ගේද, අන්‍යයන්ගේද, සතුටුදායක පමණ මුදල් තැන්පත් වශයෙන් ලබාගෙණ තිබීම.

B.—පඞ්ක්තිය.

(1) A පපංඞ්කතියේ පළමුවෙනි කාරණය දෙසට වැඩකිරීම.
(2) A පඞ්ක්තියේ දෙවෙනි කාරණය දෙසට වැඩකිරීම.
(3) නියම දිනට නොගෙව් ණය එන්ට තියෙන මුලු ණය ගණනින් සියකට 15කට වැඩිනොවීම.
(4) ආණ්ඩුවේ නිලධාරින්ගෙන් උපකාරයක් නැතුව සියලුම ණය අයකිරීමට කාරක සභාව වැඩකරගෙන යෑම.
(5) අලුත් සාමාජිකයන් ඇතුල්වීමට සෙවීම හා එසේ ඇතුළත්කර ගැනීම.
(6) සමුපාකාර ප්‍රතිපත්ති හරියාකාර දැනගැනීම හා අභ්‍යාසය.
(7) අවුරුද්දකට වැඩි කාලයක් වැඩකිරීම.

C.—පඞ්ක්තිය.

(1) සාමාජිකයන් තවමත් පිටින් ණයගැනීම.
(2) සියට 15කට වඩා නියම දිනට නොගෙව් ණය ඇතිවීම.
(3) ණය අයකර ගැණීමට ආණ්ඩුවේ මුලාදෑනීන්ගෙන් උදව් උවමනාවීම.
(4) බලාසොයාගෙන වැඩකිරීම ඉතාම අඩුකම.
(5) නිතරම ණය අයකර ගැනීමට උසාවියට යෑමේ උවමනාකම.

D.—පඞ්ක්තිය.

අවලංගුකිරීමේ මායිමට පැමිණ තිබීම.

සම්පූර්ණ වර්ෂයක් වැඩ නොකරනලද සමාගමක් මේ පඞ්ක්තිවලට ගණන් ගන්නේ නැත.

මේ බෙදීමේ ප්‍රතිඵල මෙසේය :—

A පඞ්ක්තිය : නැත.
B පඞ්ක්තිය : සමාගම් 67යි.
C පඞ්ක්තිය : සමාගම් 121යි.
D පඞ්ක්තිය : සමාගම් 81යි.
E පඞ්ක්තිවලට නොබෙදුපුවා : 91යි:

A පඞ්ක්තියේ පලමුවෙනි දෙවෙනි උවමණා කාරණා හා අන්තිම උවමනාකර තිබෙන කාරණයද සියලුම සමාගම්වලට සවාසයක් මෙන් දුන් පැමිණ තිබේ. නුමුත් සීමාරහිත වගකීම පිට මුදල් ගණුදෙනුකරණ සමාගමක් මේ කියන්ට යෙදුන ස්ථානයකට නොපැමිණියේ නම් A පඞ්ක්තිය යටතට එන්ට කිසිම උරුමයක් නැත එමෙන්ම B පඞ්ක්තියේ සමාගම් කීපයක්ම ඒ ස්ථාන යටතේ ගණන් ගැනීමට නොහැකිවූයේ එහි පලමුවෙනි දෙවෙනි කාරණා ඉෂ්ටනූන නිසාය. පසුගිය අවුරුද්දේදී මම විසින් ලියන්ට යෙදුන ආකාර මේ සමාගම්වල වැඩකරණ ප්‍රමාණය තවමත් ඉතාම් පටුය. එසින් බොහොමයක් සීමාරහිත වගකීම භාරගන්නේ වීනුත් එයින් ප්‍රයෝජනයක් ගැණීමට උත්සාහ නොකරණ සමාගම්ය.

26. ලංකාවේ දැනට තිබෙන සියලුම සමාගම්වල ගෙවනලද කොටස් මුදල

රු. 497,775 60ක්ය. මෙය සමාගමකට රු. 1,382ක් වේ. සාමාජිකයෙකුට රු. 15·5ක්ය. සමාගම්වලටම අයිති මුදල් වැඩකරණ මුලු මුදලෙන් සියට 59ක්ය. පංචාල දෙශයේ මෙය සියට 36.5ක්ය. සමාගම් විසින් ඒවායේ සීමාරහිත වග කීමේ සම්පූර්ණ ප්‍රයෝජනය පාවිච්චි නොකරත්.

27. තැන්පත් මුදල් පසුගිය අවුරුද්දේ තිබුන රු. 67,689න් මේ අවුරුද්දේ රු 114,102කට වැඩිවී තිබේ. මෙය සතුටුදායක ලකුණක්ය. නුමුත් මේ ගණන එක සාමාජිකයෙකුට රු. 3·4ක් වේ. මෙය ඉතාම අඩුගණනක්ය. තැන්පත් මුදල් කොහෙත්ම නොලැබු සමාගම් බොහෝ ගණනක් තවම තිබේ. එනම්: නැගෙණ ඉර පලාතේ තිබෙන සමාගම් 53නේම තැන්පත් මුදල් එකම සතයක්වත් නැත

ගම්බද උදවියට යහමින් ඉතුරුකර ගැනීමට පුරුද්දක් නැත. එසේ ඉතුරු කරගන්න මුදලවත් බැංකුවේ දමන සිරිතකුත්ද නැත. මෙයාකාර පුරුද්දක් ඇතිකිරීමට බොහෝ කාලයක්යාය. ගෙවනලද කොටස් මුදලද, තැන්පත් මුදලද තරමක් සෑහෙන තරම් ඉතුරුකරගන්නාලද මුදලක් මෙන් ගණන්ගත්විට මෙයාකාර සකසුරුවම්කම ගැන පටන්ගැන්මක් කරතිබෙනබව පෙනේ.

28 සමාගම්වල ලාභ ගිය අවුරුද්දේ ගණන රු. 40,119:44ක්ය. මෙය මේ වර්ෂයේදී රු, 60,439 75ක්වී තිබේ. මේ වැඩිවීමට හේතුව ණය වැඩිය හොඳින් අයකර තිබීමය.

29. අවුරුද්දතුළදී තිබෙණ ණය මුදල රුපියල් 722,544 68ක්ය. පසුගිය වර්ෂයේදී දීතිබුන මුදල රුපයල් 593,009·64ක්ය. ඊට ඉහතින් අවුර ද්දේ දී තිබුනේ රුපියල් 444,035·34ක්ය මෙය සමානකර බැලුවිට හුඟක් මෙන් පෙනේ නුමුත් මෙය සාමාජිකයෙකුට වශයෙන් බෙදා බැලුකල එක්කෙනෙකුට රුපියල් 22ක්ය මෙය බොහොම ·දිය බුරුමයේ ගණන එක්කෙනෙකුට රුපියල් 209ක්ය ජේගුවේ රුපියල් 373ක්ය (බෙදාදීතිබෙන්නේ පොලී සියට 15½ ගණනේය) සින්ඩ් හෙවත් සින්ධි පලාතේ රු. 209ක්ය. මේ ගණන ගිය අවුරුද්දේ ගණනට වඩා ටිකක් හොඳය. ගිය අවුරුද්දේ ගණන රුපියල් 17ක්ය. සමාගම් ගණනක්ම සීමාරහිත වගකීමේ ප්‍රයෝජනය තේරුම් අරගෙන එය පාවිච්චිකරන්ට උවමනා බව දැනගෙන සිටිත්. එනම්, සාමාජිකයින් 17 දෙනෙකුගෙන් යුත් එක සමාගමක් රුපියල් 20,700ක ගණු දෙනු කරත්. මේ මුදල සියල්ලම ණයට දී තිබේ. මෙය ලියාපදිංචිකරන්ට යෙදුනේ 1927 අගෝස්තු මාසේදීය.

අයකරන්ට යෙදුන ණය මුදල රුපියල් 601,616·58ක්ය. නුමුත් අප්‍රේල්මස 30වෙනිදට නියම්කාල් පසුවූ ණය මුදල රුපියල් 160,537 3ක් විය. මේ ගණන සියට 20·4ක් වන්නේය. ගිය අවුරුද්දේ කාල් පසුවූ ණය ගණන සියට 24·3ක්ය. මේ ක්‍රමයෙන් අඩුවීගෙන යෑම සතුටුදායක කරුණක්ය. මෙය මීටත් වඩා අඩුවෙන්ට තිබුනේය. නුමුත් එසේ නුවූයේ මඩකලපු පලාතේ බොහොම ලොකු මුදලක් සියට 35·5ක් පමණ කාල් පසුවූ ණය තිබෙන නිසාය. නුමුත් මේ සමාගම් ගණන කල්පනාකර බලනකල මේ වැරද්ද තුනීවීමට කරුණු තිබේ. මක්නිසාදයත් සෑහෙන පමණ උගැන්වීමක් නොමැතිව සමාගම්වලට යහමින් මුදල් දීමය. සම හරවිට අර්ථසංරක්ෂණය අතින් කිසිම ප්‍රයෝජනයක් නැති දේවලට ණයදී තිබීමය.

34. බස්නාහිර පළාත.—මේ පළාතේ දියුණුව ඉතාමත්ම අසතුටුදායකය. උගත්කමේ හා ඥනවන්තකමේ ප්‍රමාණයේ හැටියට හොඳ ප්‍රතිඵල දකින්ට පුළුවන් කම් තිබේ. නුමුත් සමූපකාර ප්‍රතිපත්ති පිළිබඳ ආශාවක් ඇතිවීමට පෙණෙන ලකුණු ඉතාම ටිකය. හොඳ සමාගම් සවල්පයක් නිසා මේ පළාතේස මූපාකාරයේ නිස්සාර ගතිය මේ සම්බන්ධ පෙන්වා තිබෙන ගණන් මලින් මගහරවයි. පුද්ගලික වශයෙන් කීපදෙනෙක් හොඳ වැඩකර තිබේ. සමාගමක සියලු සාමාජිකයන් විසින් උනන්දුවකින් වැඩකරණ සමාගම් ඉතාමත් ටිකය. සමූපකාරය ආත්මාභිවෘඩිය ඇතිකරගැනීම පිණිස මාර්ගයක් බව ඉතාම ටික දෙනෙක් දැන සිටිත්. නුමුත් බොහෝදෙන කල්පනාකර තිබෙන්නේ අඩක් පින් පිණිස වැඩකරණ ස්ථානයක්ය කියාය. එසේ නැත්නම් සාමාජිකයන්ට ආණ්ඩුව විසින් වැඩකරවා ගන්ට තිබෙන සමාජයක්ය කියාය ආණ්ඩුවේ අව්චූකන්තෝරුවේ සමාගම එහි සුප්‍රසිඩ දියුණුව වැඩිකරගතයත්. හිරගෙවල් පිළිබඳ දෙපාතීමේන්තුව විසින් ආරම්භකර තිබුන සමාගම් සකසුරුවම්කම් දියුණුකිරීමේ සමාගමක් හැටියට ප්‍රතිසංසකරණයකොට ආඥ පත්‍රය යටතේ ලියාපදිංචිකරන්ට යෙදුනේය. ඒ සමාගම විසින් හොඳටම තේරුම් ඇතුව පණවාගන්ට යෙදුන එක්තරා අතුරු ව්‍යවස්ථාවක් නම් දෙපාතීමේන්තුවේ සිටිනාතුරු සාමාජික කමෙන් සාමාජිකයෙකුට අස්වීමට බැරිලෙසට පණවා තිබෙන අතුරු ව්‍යවස්ථාවය. මෙහි ක්‍රියා පටිපාටිය නම් බලෙන් යමක් ඉතුරුකරගැනීම හෙවත් සකසුරුවම්කම දියුණුකිරීමය. ඒ සමාගමට ණය ගන්ටත් පුළුවන්කම තිබේ. මෙයින් සිදුවියහැකි දෙයක් නම් සාමාජිකයන් රාජකාරියෙන් අස්වෙනවිට තමන්ගේම මුදලක් ඇතුව හිස සොලින්කරගෙන සමාගමේ දොරින් පිටවී තමාගේ ගමට ගොස් හරියාකාර ජීවිතයක් ගතකිරීමට පුළුවන්කමක් ඇතිවීමය. එසේ නැතුව ඔහු පිටවුන දොරලඟ සිට ණයකාරයෝ රංචුවක් පිටපසෙන් ඔහු ලුහුබඳවා එන නිසා එතන සිටම ඔහුට දුවන්ට උවමනා නැත.

මීගමුව අවට තිබෙන සමාගම් තොගයක් හොඳ බලාපොරොත්තුවක් බලාපොරොත්තුවියහැකි හොඳ පටන්ගැන්මක් ඇතිකර තිබේ. ඒවා හොඳකාර වැඩකරය කියා හොඳින්ම බලාපොරොත්තුවියහැක. මේ ගැණ ගරු පරීක්ෂක පාරිස් මහත්මයාගේ ඉතා හොඳ වැඩ ගැන ඒ මහත්මයාට සතුතිවේවා. කොළඹ දිස්ත්‍රික්කේ බෝමිරිය, කඩුවෙල සමාගම හිත සැනසීමට ඇති සමාගමක්ය. කොළඹ ආණ්ඩුවේ කන්තෝරුවල රාජකාරියෙහි නියුක්ත සුලු මෙහෙකරුවන්ගේ සමාගම ආධාර මුදලක් ඇතිකර අලුත් රෙගුලාසි පණවාගත්හ. මෙම සමාගමද තව වර්ෂයක් හොඳින් වැඩකර තිබේ.

කලුතර දිසත්‍රික්කේ සමාගම්වල තත්වය බොහොම අඩුරුදායකය.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අවුරුද්ද අන්තිමට | ... | | 63 |
| සාමාජිකයෝ | ... | ... | 7,961 |
| ගෙවාපු අරමුදල | ... | ... රු. | 148,635·56 |
| නැන්පත් මුදල | ... | ... රු. | 56,553·32 |
| ආරක්ෂක මුදල | ... | ... රු. | 24,291·35 |

35. මධ්‍යම පළාතේ සමාගම් විසින් හොඳ වැඩ කට්ටියක්කර තිබේ. සමූපාකාර ප්‍රතිපත්ති පිළිපැදීම ඉහළය. නුවර පැවැත්වූ සාකච්ඡා සභාවට බොහොම දෙනෙක් පැමුණුනෝය. සාකච්ඡාවද තීක්ෂණ නුවණින් හොඳකාර කරගෙණ යනලදී. මෙය මේ පළාත ගැණ මත්තට ඇතිවියහැකි හොඳ කාලයේ පූර්ව ලක්ෂණ

යකි. සාමාන්‍යයෙන් කල්පනාකර බලනකල වැඩකරණ ප්‍රමාණය ඉතාම පටුය. සමාගම් විසින් ඒවායේ සීමාරහිත වගකීම, ණය ගැනීම ගැණ හරියාකාර පාවිච්චි නොකරයි. තමන්ගේ උවමනාවූ උවමනාකම් පිරිමසා ගැනීමට තවමත් සාමාජික යෝ ණයගැනීමට පිට අය කරා යත්.

මැදිවක සමාගම හොඳකාර වැඩකරණලදී. මහනුවර දිසත්‍රික්කේ ඉතාම හොඳ ලේකම් කෙනෙකුට දීමට ගරුකටයුතු පී. බී. රඹුක්වැල්ලේ මහතාගේ රන් පදක්කම මේ සමාගම විසින් දිනාගන්නාලදී. ඒ. ගොඩමූනේ නීතිඥ මහතා විසින් තෑගි කරන්ට යෙදූන රිදී පදක්කම අළුතෙන් පිහිටුවන්ට යෙදූන තලාතු ඔයේ ලේකම් තැනට දෙන්ට යෙදුනේය. යටිගම්මන සමාගම විසින්ද හොඳ වැඩකර තිබේ. ගම්සීමාව කුඩාකිරීමේ ප්‍රයෝජන කල්පනාකර එසේ ගම්සීමාව කුඩාකොට ඉතාම සඵලවත් පැළයක් මැණික්දිවෙල සමාගම නමින් ඇතිකර තිබේ. හතරලියද්දේ සමාගම විසින් අමාරු වැඩ කට්ටියක් කරතිබේ. ඉතා හොඳින් වැඩ කරගෙණආ ඈත පදිංචි සහෝදර සමාජිකයන් කට්ටියක් අහක් කිරීමට තිබුන අසමැතිකම නැතිකරදමා වැඩකරන්ටවීය. මේ ගම්වලින් හොඳ සමූපාකාර ව්‍යාපාරයක් ඇතිවේය කියා මම බලාපොරොත්තුවෙමි. කොත්මලේ සහ උතුරු මාතලේ වෛයයිී ගෙනදෙන කථා බස් ගොඩක් ඇතිවූනේ වීනුමුත් එයින් හරි ක්‍රියාකාර ප්‍රතිඵල තවම ලැබුනේ නැත.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අව්රුද්ද අන්තිමට | ... | | 46 |
| සාමාජිකයෝ | ... | | 3,336 |
| කොටස් මුදල | ... | රු. | 60,241·97 |
| ආරක්‍ෂක මුදල | ... | රු. | 7,337·06 |
| තැන්පත් මුදල | . | රු. | 3,281·40 |

36. දකුණු පළාත.—මේ පළාතේ පවතින උගත්කම හා ඥනවන්තකමද, වස්තු ආඪ්‍යකමද තරමට බලාපොරොත්තු දියුණුවේ ප්‍රතිඵලයක් නැත. සමාගම් වල තත්වය බොහෝ පහත්ය. ඒවාට දී තිබෙන ආධාරයේ හැටියට ඒවායින් ලැබීතිබෙන ප්‍රතිඵල ඉතාම ටිකය. තරමක් එහේ මෙහේ යම් යම් උත්සාහගන්නා ලකුණු පෙනේ. හොඳින් වැඩකරණ සවල්ප දෙනෙක් සිටිත්. මේ වැඩ ගැණ කල්පනාකර බැලූවිට මුලු පළාතෙන්ම වැඩි බලාපොරොත්තුවක්විය නොහැකිය.

මීට ඉතාමත්ම උසස්වූ වෙනසක් නම් ඔපාත ගොලුවමුල්ල සමාගමය. එය පළාතෙන්ම හොඳ සමාගමය. එහි සාමාජිකයෝ සියල්ලම ගම්බද ගොවියෝය. ගමේ සෙකොල් ගුරුවරයෙකුගේ පවා ආධාර නැතුව සියලුම වැඩ තමන් විසින්ම හොඳකාර සමූපාකාර ප්‍රතිපත්ති පිට කරගෙණ යත්. තමන්ට උවමනාකරණ ආහාර පිණිස තුණපහෙ ආදිය සාමාජිකයන්ගේ උවමනාකම් කලින් දැනගෙන සැපයීම හොඳකාර කරගෙණයත්. ගාලු දිසත්‍රික්කේ සමාගම් අතර තරඟකිරීමට තෑගිකරන්ට යෙදූන වික්‍රමරත්න මුදලිඳුගේ පලිහ හා පදක්කම මේ සමාගම විසින් ඉතාම පහසුවෙන් දිනාගන්නාලදී.

ලබුදූව ගොඩකන්ද සමාගමද අව්රුද්දක හොඳ වැඩකර තිබේ. මෑතදී පටන් ගන්ට යෙදූන සමාගම් එකක් දෙකක්ද හොඳින් වැඩකරාය කියා මගේ බලාපොරොත්තුවයි.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අවුරුද්ද අන්තිමට | ... | | 42 |
| සාමාජිකයෝ | ... | | 6,543 |
| කොටස් අරමුදල | ... | රු. | 48,880·56 |
| ආරක්ෂක මුදල | ... | රු. | 10,213·73 |
| තැන්පත් මුදල | ... | රු. | 2,336·65 |

37. උතුරු පළාත.—මේ අවුරුද්දේ උතුරු පළාත අනිත් සියලුම පළාත්වලට ඉහළින් පැන නැග සිටිත්. මේ මොහොතේදී සමූපකාර නමැති අහසේ ඉතාම දිලිසෙන තරුව මේය. අනිත් පළාත්වල සමූපාකාරය මගින් ජයගැනීමට හැකි අමාරුකම්වලට මූනපා තමන්ගේ අලසකම මගහරවා ගැනිමට මගේ පුළුවන් තරම මහන්සි ගෙණ කාරණා කියාදීම මට තිබුනේය. නුමුත් මේ පළාතේ මට තිබුනේ දියුණුවේගනයන සමාගම් ගණන වැඩිවීමෙන් ඒවා පාලනය කිරීමට ඉන්නාවූ මූලාදෑනින් මදිවෙන්ට නැර දියුණුවූ ගමන් වේගය තරමක් අත්හිටවා ගැනීමය.

ණය ගෙවීම බොහෝ උසස්ය. නියම කලට නොගෙවාපු ණයවල ගණන වෙන පළාත්වලට වඩා බොහෝ අඩුය. එන්ට තියෙන රුපියල් 212,519·78ට නියම කල් පසු වෙච්ච ණය සියයට 6.14ක් පමණය නුමුත් මෙහි සඵලත්වයේ සතුටුදායක කාරණක් නම් මේ ප්‍රතිඵල ඉතාම හොඳ කරුණු නිසාම සිදුවීමය. එසේ නැතුව ලොකු සමාගම් කීපයකින් සුලු සමාගම් ගණනක වැරදි පාඩු වසා ඇරීම නොවේය. අමෙරිකන් මිෂන් සමාගමේ කළමනාකාරුවන්ගේ සමාගම ඉතාමත් විශාලවූද ධන වත්වූද සමාගමය. මේ සමාගම තව අවුරුද්දක් හොඳ වැඩකර තිබේ. අමුතුවෙන් කියාදෙන්ට යෙදුන දේවල් ගැණ හොඳින් ක්‍රියාකරනවත් ඇර දියුණුකිරීමට කැමත්ත තිබේ. මේ පළාතේම හොඳටම නරක සමාගමක් සොයාගැනීම අමාරුය. එයාකාර හොඳ වැඩකිරීම ගැන දියයුතු ප්‍රංශස්සාව වැඩකරණ බොහෝ දෙනෙකුට බෙදියා යුතුය. සමූපාකාර ප්‍රතිපත්තිපිට වැඩකිරීම ඉතාම ඉහළින් තිබෙන්නේ වව්නියාවේ අසල ගම්වලය. මේ අසල සමාගම් කීපයක් තිබේ. එයින් එකක වත් වරදක් සොයාගනීමට අමාරුය. මේ සමාගම්වල හොඳකාර ඉගැන්වීම කර තිබේ. ඒවාගේම හොඳකාර මුදල් සැපයීමද කළේය. එසේ හෙයින් ඔවුන්ගේ වරදකින් නොව වණීව හිඟකමින් මෝසම් තුනක්ම වණීව නැතිකමින්වූ ගොවිතැන් පාඩුවීමෙන් සමාගම්වල වැඩට බාධාවක් නොවීය. එය කෙසේ සිදුවීද කිව හොත් ආණ්ඩුව විසින් දුර්භික්ෂ පිණිස වැඩ පටන්ගත් නිසා ඒවායින් ලැබූ මුදල්ද, වැඳගම්මකටු ගන්ට බැරි ගවයින් විකුණාගත් මුදල්ද ඔවුන්ගේ ණය ගෙවීම පිණිස පාවිච්චිකොට සමාගම්වලට ගෙවියයුතු ණය මුදල් සතයක්වත් හිඟ නොතියා ගෙවා තිබේ. මේ ගම්වාසියෝ බොහෝ දුප්පත් අයය. මේ දිසත්‍රික්කේ එක කොටසක තිබෙන සමාගම් බැලීමට මම එහි පැමිණිවිට මම විසින් බැලීමට යැමට අඩංගු නොකළ සමාගමක ලේකම් කෙනෙක් මට සම්භවී බොහෝ තරහ භාවයක් මට පෙන්විය. ඒ මක්නිසාද කීවොත් මගේ පරීක්ෂාකිරීමේ සමාගම් ලැයිස්තුවට ඒ සමාගමත් අඩංගුනොකළ නිසාය. ඔහුගේ සමාගම මම බලන්ට ගිය අන්‍ය සමාගම් මෙන්ම හොඳ බව කියා සිටියේය (මේ කීම හරිබව පසුව ඔප්පුවිය.) මෙයාකාරප්‍රතිඵල දැකීම බොහොමත්ම ධෛර්‍ය්‍ය ගෙනදෙන කරුණකි. මේ පසුකී සමාගම් ගැණ කරපු හොඳ වැඩ ගැණ ජේ. වී. පොන්නදුරේ ගොවිකම්ෝපදේශකතැනට සතුතිකටයුතුව තිබේ.

1928ක්වූ අප්‍රේල් මස 30වෙනි දින මන්නාරම් දිස්ත්‍රික්කේ සමාගම්වලින්

දීපු ණය රුපියල් 12,704ක් තිබුණේය. මෙයින් කල් පසුවූ ණය තිබුණේ රුපියල් 180ක් පමණය. මුල්ලද්දුව දිස්ත්‍රික්කේ තිබුණු ණය රුපියල් 12,639ක්ය. මෙයින් නියම කල්පසුවූ ණය තිබුණේ රුපියල් 20ක් පමණය. මේ අසරණ ගම්මුන් විසින් ඉදිරිපත්කළ ආදශීය වැනි ආදශී මුළු ලංකාවේම සමාගම්වලට ගේන්ට පුළුවනි නම් මම කැමතිය. නුමුත් මේ දී තිබෙන ණයවලින් සෑහෙන ප්‍රමාණයක් අලුත දෙන්ට යෙදූන ණය බැව් කීමද සෑහෙන බැව් මම සිතමි. ඒ වාගේම සමාගම් ගණනක්ද එසේම අලුතෙන්ම පිහිටවනලද සමාගම් බැව්ද සැලකිය යුතුය. එබැවින් මේ සමාගම් මීට පෙර සමාගම්වලට ලැබුණාට වඩා ඉගැන්වීමේ සහ පරීක්ෂා කිරීමේ ප්‍රයෝජන බුක්තිවිඳින්ට විය

| | | |
|---|---|---|
| සමාගම්වල ගණන, අවුරුද්ද අන්තිමට | ... | 71 |
| සාමාජිකයෝ | ... | 4,5995 |
| ගෙවනලද කොටස් මුදල | ... රු. | 11,102·73 |
| ආරක්ෂක මුදල ... | ... රු. | 19,128·13 |
| තැන්පත් මුදල ... | ... රු. | 41,317 03 |

38. වයඹ පළාත.—මේ පළාත දියුණුවේගනගිය ගමකින් තරමක් අඩුවී තිබීමට හේතුව කුමක්ද කියා මට හරියාකාර තේරුම් ගැණීමට අමාරුවී තිබේ. මේ පළාත ගිය අවුරුද්දේදී සමූපකාර ප්‍රතිපත්ති ගැණ වෙන පළාත්වලට වඩා ඉතා ඉහලින් තිබුණ නමුත් මේ අවුරුද්දේදී උතුරු පළාත හා මධ්‍යම පළාතත් මේ පළාතට ඉහළින් යෑමට ඉඩහැර තිබේ. උතුරු මධ්‍යම පළාත මේ පළාතට වැඩියෙන් කිට්ටුවෙන්ට ගමන්කරත්.

මහගල්බොඩමෙගොඩ සහ වාරියපොල යන සමාගම් දෙකම නොඳට වැඩකර තිබේ. ඒවායේ ගම්සීමා බෙදා අඩුකිරීමට කටයුතුකර තිබේ: මෙය මේ සමාගම් වලට කනගාටුවක්වීමට හේතුනොවේය කියා මට සතුතකය. නයිනමඩම සමාගම සවල්පදෙනෙකුගේ සතුතිකටයුතු උනන්දුවෙන් කරන්නාවූ වැඩ නිසා මුදල් ගණුදෙනු අතින් හොඳ තත්වයකට ගෙනැවිත් තිබෙන්නේ වී නුමුත් හරියාකාර කාරණා තේරුම්ගෙන නොයි සමාගමක් වුවත් සමූපකාරයපිට වැඩ නොකළහැකි සාමාජික ගණනද ගම්සීමාවද අඩුනොකර තිබෙනවා දැක්ම මට කණගාටුවට කාරණයකි.

| | | |
|---|---|---|
| සමාගම් ගණන, අවුරුද්ද අන්තිමට | ... | 39 |
| සාමාජිකයෝ | ... | 3,098 |
| ගෙවාපු අරමුදල ... | ... රු. | 43,378 66 |
| ආරක්ෂක මුදල ... | ... රු. | 5,077·71 |
| තැන්පත් මුදල ... | ... රු. | 3,880 38 |

39 නැගෙණහිර පළාත —මඩකලපුව දිස්ත්‍රික්කය ගැණ කල්පනාකර බලන කල සමහරවිට ජයගැනීමට අමාරු තරම් අමාරුකම් තිබෙනබව පෙනේ. පළමු පටන්ගන්න කාලයේදී බලෙන් සමාගම් ඇතිකිරීමද, ඉගැන්වීමක් නැතුව යහමින් මුදල්දීම කරණකොට ගෙන වැඩි විභාගයක් නැතුව ප්‍රයෝජන නොවන අන්දමට යෙදීමට යහමින් මුදල් ණයට දීමෙන් අලාභහානි සිදුවිය. සමහර සමාගම්වලට දීපු ණයවලින් ප්‍රයෝජන ලැබීය. නමුත් සමූපකාර සොයා බලාගැනීම අඩු

කමෙන් ලැබුනාවූ ලාභ ප්‍රයෝජන ණය නොගෙවීම නිසා නැතිවීයන්ට යෙදුනේය. මෙයින් සිදුවෙන්ට යෙදුන ප්‍රතිඵලයනම් නියමකලට නොගෙවූ ණය රාශියක් එකතු වීමයි. මෙසේ ණය එකතුවීම අවුරුදු ගණනක් තුලම වැඩිවී ගියේය මෙය හරි ගස්සා ගන්නාතුරු එක්සත් සමාගම්වලට මඩකලපුවේ වැඩි බලාපොරොත්තුවක් නැත. තරමක් දියුණු අතට හැරීගොස් තිබෙන නිසා සමාගම්වලට දීපු ණය මුදල් තරමක්වත් නැතිවේය කියා වඩා බලාපොරොත්තු වෙන්ට උවමනාවක් නැත. මේ ණය ගෙවන්ට නම් සමාගම්වලට අලුතෙන් ආයිත් මුදල් උවමනාය මේවා අය කරගැනීම කරණකොටගෙන සමූපාකාරයේ ගරුත්වය බොහෝ දුරට නැතිවීයන්ට ගොස් තිබේ. නියම කලට නොගෙවාපු අයගේ ගණන හොපමණ වැඩිද කීවොත් සභාවාරවල් පැවැත්වීමද අමාරුවී තිබේ. සභාවාර නැතුව උවමණාකරණ ඉගැන් වීමද කළනොහැක දැනට තිබෙන අතුරු ව්‍යවස්ථාවල තරම කිවොත් රයිපීෂන් ඔහුගේ වලෙන් නැගිට යෑමට තරම් කාරණාවේ. එයින් එක අතුරු ව්‍යවස්ථාවකින් ආරක්‍ෂක මුදල බෙදාගැනීමට සලස්වයි පළාතෙන් හොඳයයි කල්පණාකර සිටිය සමාගමක් විසින් ඒ සමාගමේ තිබෙන ආරක්‍ෂක මුදල බෙදාගැනීම සඳහා සමාගම නිශ්ප්‍රභාකරදමන්ට ඉල්ලා සිටීම මාව නැතිගැස්සීමට තරමට කරුණක් විය. මේ සමාගම් ගැන ඉතාමත්ම යහමින් කියන්ට තිබෙන්නේ නම් මේ සමාගම් දැන් ඉහළට ගමන්කරන්ටවී තිබෙනබවයි: නුමුත් ගමන තවමත් බොහොම තරකය. දිස්ත්‍රික්කේම හොඳ සමාගම නාසිපඩිවුනේ සමාගමය. එයින් මේ මගින් කුමක් කරන්ට පුළුවන්ද කියා පෙන්වයි. මම බලාපොරොත්තුවෙන්නේ දිසත්‍රික්කය පුරාම මේයාකාර ඇතිකරන්ටය. කල් පසුවෙච්ච ණය අයකිරීම පිළිබඳ ප්‍රධාන මූලාදෑනින් විසින් වටිනා වැඩකර තිබේ. මේ ණය දූන් කථාන්තරයද ඒවා ගොඩ ගැසුන අන්දමද ගැන කල්පණාකරනවිට මෙසේ මූලාදෑනින්ගේ මාගීයෙන් පමණක් මේවා අයකල හැකිය මී බැංකුව හා ඒ පාලනයකරන සභාව පිළිබඳ මෙහි අන් තැනක සඳහන්වේ.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කුවේ පරණ ත්‍රිකුණාමලය සමාගම අවලංගුකරන්ටවූයෙන් දැන් තියෙන්නේ එන්ට තියෙන ණය රුපියල් 22,551න් කල්පසුවූ ණය රුපියල් 100ක් පමණය.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අවුරුද්ද අන්තිමට | ... | | 53 |
| සාමාජිකයෝ | ... | ... | 2,134 |
| ගෙවාපු අරමුදල | ... | . රු. | 48,628·50 |
| ආරක්‍ෂක මුදල | ... | ... රු. | 19,386·73 |
| තැන්පත් මුදල් | ... | ... රු. | 835 |

40. උතුරු මධ්‍යම පළාත.—උතුරු මධ්‍යම පළාත ඉතාම සතුටුදායක ප්‍රතිඵල ලැබුනාවූ තවත් පළාතකි. බොහෝ කලක් යනතුරු මේ පළාතේ සමාගම්වලට ලොකු මුදල් ගණන ගණුදෙනු කිරීමට බලාපොරොත්තුවිය නොහැකි නමුත් සමාගම් හොඳට වැඩකරන්ට පුළුවන්බව මේ පළාතේ මිනිසුන් විසින් පෙන්නුම්කර තිබේ. සමහර තැන්වල මෙහි ප්‍රයෝජන හරියාකාර අත්පත්කරගෙණද තිබේ. ඔවුන් ඉතාමත්ම සත්‍යවාදී මිනිස්සුය. එයින් කිසිම පලුද්දක් නැත. ජාපනෙන් පැමිණ සිටින කඩකාරයින්ගෙන් බොහෝවිට ඔවුන්ට ලැබෙන සැලකීමේ තරම කොපේද කියා බැලුවහොත් ඉතාමත්ම හද අන්දමේ හරය ඇතිකිරීමට කාරණාවේ. පළාතේම ගණන් පිළිබඳ කල්පනාකර බලනවිට කල් පසුවූ ණය ඇති පරණ සමාගම් ටිකක් විසින් ඒවා නරක්කර තිබේ. මේ සමාගම් අවලංගු කිරීමට මම කැමති

නැත. මක්නිසාදයත් මේ සමාගම්වලට හරියාකාර කාරණා කියාදුන්කල නැවතත් ඒවා ප්‍රාණවත්වේය කියා සිතන නිසාය. මේ පළාතේ ලඟදීම ඉන්ස්පැක්ටර් කෙනෙක් නවත්වන්ට යන නිසා මේ සමාගම් ස්වල්ප කාලයකදී හරිගස්සාගන්ට පුළුවන්ය කියා මම බලාපොරොත්තුවෙමි. ඉගෙනකියාගැන්ම ඒ හැටි උසස් නොවේ. එම නිසා මේ අයට වෙන අයට වඩා හොඳට පුහුණුකිරීමද, සොයාබලාගැන්මද උවමනාය. බොහෝවිට කියනු ලබන කාරණයක්වූ ගමේ සෙකෝලේ ගුරුවරයාගේ හෝ ගම්මූලාදෑනියාගෙ හෝ උපකාරයක් නැතුව ලංකාවේ ගම්බද ගොවීන්ට එක්සත් සහකාර සමාගමක් තියා වැඩකරගැනීම හෝ එම සමාගමක ගණන් හා පොත්පත් තබාගැනීම නුපුළුවන්ය කියන මතය සම්පූර්ණයෙන්ම මේ ගම්වල අය විසින් නැතිකර තිබේ. මේ කියමන සැබෑවක්ය කියනවා වෙනුවට අපට කියහැක්කේ ඒ කියනලද කිසිම ආධාරයක් නැතුව ඉතාමත්ම හොඳ සහකාර ප්‍රතිපත්ති පිට වැඩකිරීම ඉතාමත්ම උසස් භාවයට පැමිණී තිබෙන්නේ මේ ගම්වල වැසියන් අතරය කියාය. මෙයාකාර කැළෑ පළාතක තිබෙන ගමක සමාගමක් විසින් අවුරුද්ද තුලදී රු. 2,749ක් ණය වශයෙන් සමාගමේ සාමාජිකයන් 57 දෙනාගෙන් 56 දෙනෙකුට දෙන්ට යෙදුනේය. ගොවිතැනට ඉතාමත්ම නරක අවුරුද්දක් උනේ වීනුමුත් නියම කාලට නොගෙවාපු එකම සතයක ණයක් නැතුව ගියේය.

කැබිතිගොල්ලෑව කියන ගමේ හොඳ සමාගමක් විසින් ආණ්ඩුවේ ණය මුදලක ආධාරත් ඇතුව ජාපනේ සාඩකාරයන්ට ණයවී වාල්වීමෙන් සාමාජිකයන් මුදවාදමා ඒ අසල ගම්වලද එයින් ලැබුනාවූ ඵල ප්‍රයෝජනවල උනන්දුව ඉතාම සතුටුදායක ලෙස අසල සෑමතැනම පැතිර ගොස් ඒ අසල සමාගම් වැළක් පැනනැගීමට හේතුවිය. මේවා සමහරක් ලියාපදිංචිකර තිබේ. තවත් සමහරක් ලියාපදිංචි කිරීමට උවමණා පුහුණුවීම ලබාගෙනයත්. මිහින්තලේදී පවත්වන්ට යෙදුන පුහුණුවීමේ පඩසාන් හා සාකච්ඡා සභාවේදී මේ අයවල් විසින් පෙන්වන්ට යෙදුන උනන්දුව හා තීක්ෂණ ඥාණාන්විත ගතියද මේ පළාතේ මේවායේ දියුණුව ගැණ කියහැකි ශුභ නිමිත්තකි: මේ ව්‍යාපාරයේ දියුණුව ගැණ මගේ තදබලම බලාපොරොත්තුවක් ඇති පළාත නම් මේ පළාතවේ.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අවුරුද්ද අන්තිමට | ... | | 20 |
| සාමාජිකයෝ | ... | ... | 955 |
| ගෙවාපු කොටස් අරමුදල | ... | රු. | 9,351·85 |
| ආරක්ෂක මුදල | ... | ... රු. | 1,854·81 |
| තැන්පත් මුදල | ... | ... රු. | 273·25 |

41. ඌව පළාත.—මේ පළාත බොහෝ අතින් උතුරු මධ්‍යම පළාත මෙනි. නුමුත් පසුගිය කාලයේදී මේ පළාත උතුරුමැද පළාත මෙන් සලකා නොබැලුහ. එමනිසා මූලාරම්භය් වැඩ මහත් රාශියක් කිරීමට තිබේ. හොඳකාර පුහුනුකිරීමක් නැතුව කිසිවක් කළනොහැක: නුමුත් ලඟදීම මෙහි පරීක්ෂක කෙනෙක් නැවත් වීමට යන නිසා මේ ගැණ වැඩකිරීමට ඉතාම සාරවත් පසක් ඇතිවේය කියා බලාපොරොත්තුවියහැක.

වැල්ලවායේ සුදුපනාවෙල මෑතදී සමාගමක් ආරම්භකෙළේය. මෙහි මෙවැනි සමාගමක උවමනාකම ඉතාම තදෙන් වැටහී ගියේය. මක්නිසාදයත් ඒ පළාතේ

අයකරන පොලිය ඉතාම් වැඩි නිසාය. සමාගම පටන්ගත් හැටියේම ඔවුනොවුන් අතරේ තදබල ප්‍රශ්ණයක් ආරම්භවූයෙන් ඒ ගැණ කාලය මිඩංගු කිරීම මිස වෙන කාරණා ගැණ යමක් කිරීමට ඔවුන්ට කාලයක් නැතිවිය. එම නිසා සමාගම වැඩ පටන්ගෙණ අමාරු අනුට හැරෙන්ට පෙර ඉක්මණින්ම අවලංගුකර දැමීය. කැන්ද ගොල්ලේ පිහිටෙව් සමාගම විසින් හොඳ පටන්ගැන්මක් ඇතිකර තිබේ.

නුමුත් සමාගම් පිහිටුවීම ගැණ ඉතාමත්ම වැඩියෙන් වැඩකර තිබෙන්නේ වෙල්ලස්සේය. මේ පළාතේ පදිංචිකාර වැසියෝ ඒ තරම් වැඩියෙන් ණයවී නැත. ඒවාගේම ඔවුන්ගේ උවමනාකම්ද වැඩිය නැත. බකිනිගහවෙල හොඳ මතු බලා පොරොත්තුවියහැකි සමාගමක් තිබේ. නුමුත් මේ අසල තිබෙන අනිත් සමාගම් සැහෙණ ප්‍රමාණ ඉගෙණීමක් නැතුව විසාල ගම් සීමාවක්පිට ලියාපදිංචි කරවීමට මාව කැමතිකරවා තිබේ. නුමුත් වාසනාවකට මෙන් මේ වැරද්ද මගඅරවාගන්ට බැරි තරම් දුර නොගොස් තිබේ. මකුල්ලේ සමාගමේ වංචාකාරවූ ලේකම් කෙනෙක් විසින් ඔහුගේ අනිත් සමාජිකයන් රවටා බොරු අත්සන් තැබීමෙන්ද, සමාගමේ මුදල් ප්‍රමාණයක් වංචාකරගැනීමෙන්ද, ශ්‍රෙෂ්ඨාදිකරණයේ වරදකාරයා වීමෙන් මේ සමාගම්වල නිල භාරගැනීමෙන් මෙයාකාර දේ සාමාන්‍යයෙන් සිදුවෙනවායයි භයක් අටගෙන තිබේ සාමාජිකයන් සමහරදෙනෙක් ඔවුන්ට හිතට වැදී තිබෙන අන්දම මෙසේය කියා මා සමාගම කිවෝය. නුමුත් ඒ අය විසින් ඔප්පුවල තිබා තිබෙන හොර අත්සන් පෙන්වීමෙන්ද, මේ හොරකමේ තදබල ගතිය පෙන්වීමෙන්ද, මෙය හරිවෙලාවට සොයා නොගත්තේනම් ණයක් ආදිය නොගත් බොහෝ දෙනෙකුගේ අත්සන් බොරුවට තැබීමෙන් ණයක් නොගත් අයවලුන්ට ණය ගෙවන්ට සිදුවෙන බැවින්ද, බොහෝ හිරිහැර අලාභ හානි පැමිණෙන්ට තිබුණබව කියාදුන් පසු ඒ වංචාකාර ලේකම්ට ලැබුණ අව්වුව සෑහෙන බවත්, ඒ අයට සිදුවුන දෙසින් මේ සමාගම්වල වැඩකරණ අවංක සාමාජිකයන්ට භයවීමට කරුණක් නැති බවත් ඔවුන්ට දැනීගියේය.

| | | | |
|---|---|---|---|
| සමාගම් ගණන, අව්රුද්ද අන්තිමට | ... | | 13 |
| සාමාජිකයෝ | ... | ... | 2,730 |
| ගෙවනලද අරමුදල | ... | .. රු. | 11,254 10 |
| ආරක්ෂක මුදල | ... | ... රු. | 1,628·94 |
| තැන්පත් මුදල | ... | ... රු. | 3,965·96 |

42. සබරගමු පළාත.—මා යටතේ වැඩකරණ මූලාදෑනින්ගේ මදකම කරණකොටගෙන රත්නපුර දිස්ත්‍රික්කේ එක්සත් සමාගම් දියුණුව ගැණ කිසිවක් කරන්ට ලැබුනේ නැත. හරියාකාර බලාසොයාගන්ට බැරිනම් මම සමාගම් පිහිටවන්නේ නැත. ගොඩකාවෙල හොඳ සමාගමක් තිබේ. තව ටිකක් ධෛර්‍යයීදී වැඩකරන්ට වුවහොත් මේ අසල හොඳ සමාගම් ටිකක් ඇතිවෙන්ට කාරණා පෙනේ. බලන්ගොඩ අසලද දැනට තිබෙන රටේ මහත්මයාගේ මුලු පළාතටම අයිති එක සමාගමක් වෙනුවට අලුත් සමාගම් ඇතිකිරීමට ආසාවක් පෙන්වයි. මේ ගැණ ධෛර්‍යයීදී වැඩකිරීමට උඩව පළාතේ නවත්වා සිටින පරීක්ෂකතැන යවං වැඩකිරීමට කට යුතු කරණවාය.

මධ්‍යම කොඨසය භාර මූලාදෑනින් විසින් බලාසොගෙන වැඩකරණ කෑගල්ල දිස්ත්‍රික්කේ බෙලිගල් කෝරලේ සමාගම් කීපයක් තිබේ. මේ සමාගම් ආරම්භ

වීවට මුල්ව ක්‍රියාකාළේ කෝරළේ හාර රටේ මහත්මයා හා ඒ ගම්මුලාදෑනින්ය. ඔවුන් සාමාජිකයන් විසින් මෙහි වැඩකරගෙණයෑව කිව්ට ඒ ගැණ බොහොම හැඟී ගැන්මක් ඇතිවී තිබේ. මේ කාරුණක් නැති නැතිගැන්ම වෙනුවට මේ කෝරළෙන් හොඳ යමක් සිදුවේය කියා මම බලාපොරොත්තුවෙමි. දැනට සමාගම් හයක් විසින සමාගම් 60ක වැඩකරන්ට උත්සාහකාරණවාය. එකිනෙක්කතාගේ දැනහැඳිනගෙන සොය බලාගැන්ම තුපුළුවන් තිසා සමාගම්වල නිලධාරීන් විකෙදෙනොක් තුළ සමාගම්වල සියලුම වැඩවල බැරගැල්ලු දැනට පැවරී තිබේ.

| | | |
|---|---|---|
| සමාගම්වල ගණන, අව්රුද්ද අන්තිමට | | 12 |
| සාමාජිකයෝ ... .. | | 1,705 |
| ගෙවාපු කොටස් ගණන ... | රු. | 16,383·33 |
| ආරක්‍ෂක මුදල ... ... | රු. | 2,121·84 |
| තැන්පත් මුදල ... ... | රු. | 3,880·38 |